# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

### (2010 මැයි / ජූනි)

### සමාජීය විද්‍යා පීඨය

ජාත්‍යන්තර අධ්‍යයනය - INTS -E2025

ජාත්‍යන්තර ආයතන

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි　　　　　　　　කාලය : පැය 03 යි

---

01. දෙවන ලෝක යුද්ධයට පසු ජාත්‍යන්තර ආයතන බිහිවීමට හේතු වූ සාධක හා ඒවායේ විකාශනය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. .

02. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්යභාරය ඇගයීමට ලක්කරන්න.

03. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය ( FAO – Food and Agricultural Organization) විසින් තම ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙතෙක් ගෙන ඇති පියවර මොනවාදැයි සඳහන් කර ඒවායේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කරන්න.

04. යුරෝපීය මූල්‍ය සංගමය (EMU - European Monitary Union ) පිහිටුවීමෙන් පසු යුරෝපා සංගමයේ සාමාජික රටවල් වෙත ලැබෙන ආර්ථික ප්‍රතිලාභ කවරේද?

05. කලාපීය ආර්ථික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කෙරෙහි අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය හෙවත් ආසියාන් සංවිධානයේ දායකත්වය එහි මෑත කාලීන ප්‍රවණතා ඇසුරෙන් පැහැදිළි කරන්න.

06. දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානයේ (SAARC) ප්‍රධාන අරමුණු හා එහි ආයතනික ව්‍යුහය සකස් වී ඇත්තේ කෙසේද යන්න පැහැදිළි කරන්න.

07. "ශීතල යුද්ධයේ නිමාවත් සමඟ'නොබැදි' සංකල්පය අභියෝගයට ලක්විය" - නොබැදි ව්‍යාපාරය ඇසුරෙන් විමසන්න.

08. ඕනෑම මාතෘකා <u>දෙකක් (02)</u> පිළිබඳ සටහන් ලියන්න.

    i. වසංගත රෝග නිවාරණය උදෙසා ලෝක සෞඛ්‍ය සංවිධානයේ කාර්යභාරය
    ii. ලෝක කම්කරු සංවිධානයේ ප්‍රධාන අරමුණු හා කාර්යභාරය
    iii. බහු ආංශික කාර්මික හා ආර්ථික සහයෝගිතාව සඳහා වන බෙංගාල බොක්ක පුරෝගාමීත්වය පිළිබඳ වැඩසටහන ( BIMSTEC)

*****************************